# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2320/63 - 2023 පෙබරවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2023.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත**

**9 වන වගන්තිය යටතේ වූ නියමය**

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ 9 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින්, මේ නියමය මගින්, 2017 දෙසැම්බර් මස 21 වන දින අංක 2050/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද උපලේඛනයේ දක්වා ඇති ''ගගන නාවික පහසුකම් සහ ගගන යාත්‍රාංගණ වලට ආබද්ධ ඉඩම්'' පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. ''1. රත්මලාන, කඳවල පාරේ පිහිටි සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම'' යන වචනවලට ඉක්බිතිව ම වහාම පහත වචන ඇතුල් කිරීමෙන් :-

''බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක. 543 A, කඳවල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි වර්ෂ 2010/12/30 දිනැති සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 521001 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 06 හි කැබලි අංක 95 මගින් නිරූපිත බෙදා වෙන්කරන ලද හෙක්ටයාර් එකයි දශම පහයි හතයි හතයි හය (හෙක්ටයාර් 1.5776)ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ ඉඩම් කොටස, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ එකී සැලැස්මට අනුව එකී කැබලි අංක 95ට මායිම්,

උතුරින් : අංක 521001 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 6 හි කැබලි අංක 94 සහ කැබලි අංක 128 (දවටගහ පාර)

නැගෙනහිරින් : අංක 521001 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 6 හි කැබලි අංක 128 (දවටගහ පාර), කැබලි අංක 127, කැබලි අංක 126 සහ කැබලි අංක 125

දකුණින් : අංක 521001 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 6 හි කැබලි අංක 125, කැබලි අංක 124, කැබලි අංක 123, කැබලි අංක 122, කැබලි අංක 121, කැබලි අංක 120, කැබලි අංක 116, කැබලි අංක 115 සහ කැබලි අංක 114

බටහිරින් : අංක 521001 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 6 හි කැබලි අංක 114, කැබලි අංක 105, කැබලි අංක 104, කැබලි අංක 96, කැබලි අංක 94''

2. ''2. අත්තිඩියේ පිහිටි ගගන නාවික සන්නිවේදන සම්ප්‍රේෂණාගාරය, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම'' යන වචනවලට ඉක්බිතිව ම වහාම පහත වචන ඇතුල් කිරීමෙන් :-

(i) ''බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක. 543B, අත්තිඩිය දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි වර්ෂ 2010/12/30 දිනැති සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 12 හි කැබලි අංක 3 මගින් නිරූපිත බෙදා වෙන්කරන ලද හෙක්ටයාර් පහයි දශම පහයි බිංදුවයි පහයි හය (හෙක්ටයාර් 5.5056) ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ ඉඩම් කොටස, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ එකී සැලැස්මට අනුව එකී කැබලි අංක 3 ට මායිම්,

උතුරින් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 11 හි කැබලි අංක 101 සහ අංක 521002 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 12 හි කැබලි අංක 81, කැබලි අංක 82, කැබලි අංක 114, කැබලි අංක 115, කැබලි අංක 116 සහ කැබලි අංක 119

නැගෙනහිරන් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 12 හි කැබලි අංක 97, කැබලිඅංක 95, කැබලි අංක 6, කැබලි අංක 5 සහ කැබලි අංක 105 (අත්තිඩිය පාර)

දකුණින් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 12 කැබලි අංක 105 (අත්තිඩිය පාර)

බටහිරින් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 11 හි කැබලි අංක 34, කැබලි අංක 35 සහ කැබලි අංක 83

(ii) ''බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක. 543B, අත්තිඩිය දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි වර්ෂ 2010/12/30 දිනැති සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 11 හි කැබලි අංක 101 මගින් නිරූපිත බෙදා වෙන්කරන ලද හෙක්ටයාර් පහයි දශම බිංදුවයි බිංදුවයි තුනයි පහ (හෙක්ටයාර් 5.0035) ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ ඉඩම් කොටස, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ එකී සැලැස්මට අනුව එකී කැබලි අංක 101 ට මායිම්,

උතුරින් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 11 හි කැබලි අංක 34, කැබලි අංක 84, කැබලි අංක 85, කැබලි අංක 86, කැබලි අංක 87, කැබලි අංක 88, කැබලි අංක 90, කැබලි අංක 91, කැබලි අංක 94 සහ කැබලි අංක 95

නැගෙනහිරින් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 12 හි කැබලි අංක 80, කැබලි අංක 81, කැබලි අංක 3 සහ අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 11 හි කැබලි අංක 100

දකුණින් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 6

බටහිරින් : අංක 521002 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 11 හි කැබලි අංක 34, කැබලි අංක 35 සහ කැබලි අංක 83''

3. ''3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සඳහා ගම්පහ, මඩම්පැල්ලේ පිහිටුවා ඇති, ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම'' යන වචනවලට ඉක්බිතිව ම වහාම පහත වචන ඇතුල් කිරීමෙන් :-

''බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක. 59, පහළ මඩම්පැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි වර්ෂ 2004/01/19 දිනැති සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 510088 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 1 හි කැබලි අංක 2 මගින් නිරූපිත බෙදා වෙන්කරන ලද හෙක්ටයාර් එකයි දශම හතරයි හයයි හතරයි එක (හෙක්ටයාර් 1.4641) ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ ඉඩම් කොටස, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ එකී සැලැස්මට අනුව එකී කැබලි අංක 2 ට මායිම්,

උතුරින් : අංක 510088 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 1 හි කැබලි අංක 1 සහ පාර (ප්‍රා.ස)

නැගෙනහිරින් : අංක 510088 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 1 හි පාර (ප්‍රා.ස) සහ පාර (මා.සං.අ)

දකුණින් : අංක 510088 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 1 හි කැබලි අංක 1 සහ පාර (මා.සං.අ.)

බටහිරින් : අංක 510088 දරන කැඩස්තර සිතියමේ කලාප අංක 1 හි කැබලි අංක 1''

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍ය.

කොළඹ
2023 පෙබරවාරි මස 21

EOG 02 - 0266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.